OL/2022(2023)/60-S-I, II

078749

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

| 60 | S | I, II |
|---|---|---|

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2022 (2023)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2022 (2023)
General Certificate of Education (Ord. Level) Examination, 2022 (2023)

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I, II
வணிகக் கல்வியும் கணக்கீடும் I, II
Business and Accounting Studies I, II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

## ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I

**උපදෙස්:**

※ **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

※ අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.

※ **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**

※ එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

● පහත සඳහන් සිද්ධිය ඇසුරෙන් අංක **1** සිට **5** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ඉංජිනේරුවරයෙකු වන නලින් ආචාර්ය උපාධිය නිමවා 'රෝස්විලා' නම් නවාතැනෙහි වාසය කරයි. ඔහු 'විජය සූර්ය කෝෂ' නමින් ගෘහස්ථ සූර්ය කෝෂ නිෂ්පාදනය කර බෙදාහැරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යයි. නිෂ්පාදනයට අවශ්‍ය අමුද්‍රව්‍ය සී/ස සන්පවර් පෞද්ගලික සමාගම අඛණ්ඩව සපයයි. පුපුන් නිෂ්පාදන කටයුතු සඳහා සහය වෙයි. නිෂ්පාදිත බෙදාහැරීම රුවන් සතු 'වෙක්සිටි' සුපිරි වෙළෙඳසැල් ජාලය මඟින් සිදු කරනු ලබයි.

**1.** ඉහත සිද්ධියෙහි නලින් සිය නිවාස අවශ්‍යතාව සපුරාගෙන ඇත්තේ
(1) විජය සූර්ය කෝෂ ව්‍යාපාරය මඟිනි.
(2) වෙක්සිටි සුපිරි වෙළෙඳසැල මඟිනි.
(3) සී/ස සන්පවර් පෞද්ගලික සමාගම මඟිනි.
(4) රෝස්විලා නවාතැන මඟිනි.

**2.** විජය සූර්ය කෝෂ ව්‍යාපාරයේ බාහිර පරිසර සාධක පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.
(1) නලින්, වෙක්සිටි සුපිරි වෙළෙඳසැල
(2) රුවන්, සී/ස සන්පවර් පෞද්ගලික සමාගම
(3) පුපුන්, වෙක්සිටි සුපිරි වෙළෙඳසැල
(4) පුපුන්, සී/ස සන්පවර් පෞද්ගලික සමාගම

**3.** වෙක්සිටි සුපිරි වෙළෙඳසැල් ජාලය, විජය සූර්ය කෝෂ ව්‍යාපාරයට
(1) ශක්තියකි. (2) දුර්වලතාවකි. (3) අවස්ථාවකි. (4) තර්ජනයකි.

**4.** නලින්ගේ ව්‍යාපාරයේ නිෂ්පාදන සාධකයක් වන ප්‍රාග්ධනය සඳහා නිදසුනක් වන්නේ
(1) වෙක්සිටි සුපිරි වෙළෙඳසැල් ගොඩනැගිල්ල ය.
(2) සී/ස සන්පවර් පෞද්ගලික සමාගමේ ගොඩනැගිල්ල ය.
(3) රෝස්විලා නවාතැන ය.
(4) විජය සූර්ය කෝෂ ව්‍යාපාර ගොඩනැගිල්ල ය.

**5.** සී/ස සන්පවර් පෞද්ගලික සමාගම, විජය සූර්ය කෝෂ ව්‍යාපාරයට ඇල්මක් දැක්වීමට හේතුවක් වන්නේ
(1) ලාභාංශ ලබා ගැනීමට ය.
(2) අඛණ්ඩව ඇණවුම් ලබා ගැනීමට ය.
(3) නිෂ්පාදිත සාධාරණ මිලකට ලබා ගැනීමට ය.
(4) ආයෝජනයේ සුරක්ෂිතතාව තහවුරු කර ගැනීමට ය.

[දෙවැනි පිටුව බලන්න.

03030001680113749

6. වර්තමානයේ බොහෝ ව්‍යාපාර, හවුල් ව්‍යාපාරයකට වඩා සංස්ථාපිත සමාගමක් ලෙස පවත්වාගෙන යාමට රුචිකත්වයක් දක්වයි. මෙයට හේතුව වන්නේ
(1) ලාභය බෙදී යාම ය.
(2) අයිතිය බෙදී යාම ය.
(3) අසීමිත වගකීම ය.
(4) නෛතික පුද්ගලභාවය ය.

7. සීමාසහිත මැදගම විවිධ සේවා සමුපකාර සමිතිය ...........①........... අංශයේ ...........②........... ව්‍යාපාර සංවිධානයකි.
ඉහත ① හා ② ස්ථානවලට අදාළ නිවැරදි යෙදුම් පිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.
(1) පෞද්ගලික, ලාභ අරමුණු කර ගත්
(2) පෞද්ගලික, ලාභ අරමුණු කර නොගත්
(3) පොදු, ලාභ අරමුණු කර ගත්
(4) පොදු, ලාභ අරමුණු කර නොගත්

8. චෙක්පත් සම්බන්ධ ගනුදෙනුවල දී වාණිජ බැංකුව සෑම විට ම,
(1) අණකරු වේ.
(2) අණලද්දා වේ.
(3) ආදායකයා වේ.
(4) පිටසන්කරු වේ.

9. වාණිජ බැංකුවක් විසින් සපයනු ලබන පහසුකම් කිහිපයක් පහත දැක්වේ.
A - අයිරා පහසුකම් ලබා දීම
B - තැන්පතු සඳහා පොලී ගෙවීම
C - ස්ථාවර නියෝග ක්‍රියාත්මක කිරීම
D - චෙක්පත් මගින් ගෙවීම් කිරීම

ඉහත ඒ අතුරෙන්, ජංගම ගිණුම් හිමියෙකුට පමණක් ලබාගත හැකි පහසුකම් වන්නේ
(1) A සහ C ය. (2) A සහ D ය. (3) B සහ D ය. (4) C සහ D ය.

10. සන්නිවේදන මාධ්‍ය හා ක්‍රම කිහිපයක් පහත වගුවේ දැක්වේ.

| සන්නිවේදන මාධ්‍ය | සන්නිවේදන ක්‍රම |
|---|---|
| 1. වාචික | A - ෆැක්ස් පණිවිඩය |
| 2. ලිඛිත | B - දුරකථනය |
| 3. විද්‍යුත් වාචික | C - රැස්වීම |
| 4. විද්‍යුත් ලිඛිත | D - දැන්වීම් පුවරුව |

ඉහත සන්නිවේදන මාධ්‍ය දී ඇති අනුපිළිවෙළ අනුව, සන්නිවේදන ක්‍රම සමග නිවැරදිව ගළපන ලද පිළිතුර තෝරන්න.
(1) A, C, B, D (2) B, A, C, D (3) C, D, A, B (4) C, D, B, A

11. රු. 5 000 000 කට රක්ෂණය කර තිබූ නුවන්ගේ මෝටර් රථය අනතුරකට භාජනය විය. නමුත් සිදු වූ අලාභය වූ රු. 800 000 පමණක් රක්ෂණ සමාගම විසින් ලබා දෙන ලදී. මේ සඳහා බලපා ඇති රක්ෂණ මූලධර්මය වන්නේ
(1) උපරිම විශ්වාසයයි.
(2) හානි පූරණයයි.
(3) රක්ෂ්‍ය හිමිකමයි.
(4) ආදේශනයයි.

12. මිහිරි තම ගෙවත්තේ වගා කරන පලතුරු, වෙළඳසැලක් පවත්වාගෙන යන කුමාරට අලෙවි කරයි. කුමාරගෙන් මිල දී ගත් පලතුරු ඉතා රසවත් බව රුවන්ගේ බිරිඳ පවසයි.
ඉහත සිද්ධියට අනුව නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) කුමාර, මිහිරිගෙන් පලතුරු මිල දී ගැනීම තොග වෙළෙඳාමකි.
(2) රුවන්, කුමාරගෙන් පලතුරු මිල දී ගැනීම තොග වෙළෙඳාමකි.
(3) කුමාර, රුවන්ට පලතුරු විකිණීම තොග වෙළෙඳාමකි.
(4) මිහිරි, කුමාරට පලතුරු විකිණීම සිල්ලර වෙළෙඳාමකි.

13. ප්‍රවාහන මූලිකාංගයක් වන පර්යන්තය සඳහා නිදසුනක් වන්නේ
(1) බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ ය.
(2) ලංකා විදුලිබල මණ්ඩලය ය.
(3) ශ්‍රී ලංකා මාර්ග සංවර්ධන අධිකාරිය ය.
(4) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ය.

[තුන්වැනි පිටුව බලන්න.

**14.** කළමනාකරණ කාර්යයක් වන සැලසුම්කරණය සඳහා පාසලක ක්‍රියාකාරකමක් වන්නේ

(1) වර්ෂ අවසානයේ සිසුන්ගේ ප්‍රගති වාර්තා ලබා දීම ය.
(2) ශිෂ්‍ය පැමිණීමේ නාම ලේඛනය ලකුණු කිරීම ය.
(3) අංශ ප්‍රධානීන් පත් කිරීම ය.
(4) පන්ති කාලසටහන පිළියෙල කිරීම ය.

**15.** ව්‍යවසායකයෙකු තම නිෂ්පාදිතය සඳහා නැවත භාවිත කළ හැකි ඇසුරුමක් නිර්මාණය කරයි. මෙම ඇසුරුම ඇතුළත් වන අලෙවිකරණ මිශ්‍රයේ විචල්‍යය කුමක් ද?

(1) නිෂ්පාදිතය
(2) මිල
(3) ස්ථානය
(4) ප්‍රවර්ධනය

**16.** ආයෝජකයෙකුට ප්‍රාග්ධන ලාභ පමණක් ලැබිය හැක්කේ

(1) ස්වර්ණාභරණ සහ ඉඩම්වල ආයෝජනය කිරීමෙනි.
(2) ඉඩම් සහ කොටස්වල ආයෝජනය කිරීමෙනි.
(3) ස්ථාවර තැන්පතු සහ භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කිරීමෙනි.
(4) කොටස් සහ ඉතිරිකිරීමේ ගිණුම්වල ආයෝජනය කිරීමෙනි.

**17.** වැඩිවීම හර සහ අඩුවීම බැර ද්විත්ව සටහන් මූලධර්මය අදාළ වන්නේ

(1) වත්කම්වලට පමණි.
(2) වියදම්වලට පමණි.
(3) වත්කම් හා වියදම්වලට පමණි.
(4) වියදම් හා වගකීම්වලට පමණි.

**18.** ව්‍යාපාරයක ගිණුම්කරණ සමීකරණයේ හිමිකම වෙනස්වීමට බලපාන ගනුදෙනුවක් වන්නේ

(1) රු. 5 000 ක භාණ්ඩ තොගයක් ණයට ගැනීම ය.
(2) රු. 12 000 ක ව්‍යාපාරයේ විදුලි බිල ගෙවීම ය.
(3) රු. 50 000 ක ලී බඩු අත්පිට මුදලට ගැනීම ය.
(4) ණයගැතියෙකුගෙන් රු. 14 000 ක චෙක්පතක් ලැබීම ය.

**19.** රාහුල් රු. 7 000 කට මිල දී ගත් බඩු තොගයක් රු. 10 000 කට අත්පිට මුදලට විකුණුවේ ය. මෙම ගනුදෙනුවෙන් ඔහුගේ ව්‍යාපාරයේ මුළු වත්කම්වල වටිනාකම

(1) රු. 3 000 කින් වැඩි වේ.
(2) රු. 7 000 කින් අඩු වේ.
(3) රු. 10 000 කින් වැඩි වේ.
(4) වෙනස් නොවේ.

**20.** රයන්ගේ ව්‍යාපාරයේ 2023.03.31 දිනට ගිණුම්කරණ සමීකරණය පහත පරිදි විය.

| වත්කම් (රු.) | = | හිමිකම් (රු.) | + | වගකීම් (රු.) |
|---|---|---|---|---|
| 150 000 | | 100 000 | | 50 000 |

එක් ගනුදෙනුවකට පසුව ද, මෙම ගිණුම්කරණ සමීකරණයේ වටිනාකම් වෙනස් වූයේ නැත. එම ගනුදෙනුව කුමක් ද?

(1) ණයහිමියෙකුට රු. 7 500 ක් ගෙවීම
(2) ණයගැතියෙකුගෙන් රු. 10 000 ක් ලැබීම
(3) රු. 15 000 ක කොමිස් ආදායමක් ලැබීම
(4) කාර්යාලයට රු. 100 000 ක ලී බඩු ණයට ගැනීම

**21.** ව්‍යාපාරයක වත්කම් සහ වගකීම් යන දෙක ම අඩුවන ගනුදෙනුව කුමක් ද?

(1) අයිතිකරු රු. 10 000 ක් පෞද්ගලික ප්‍රයෝජනය සඳහා ව්‍යාපාරයෙන් ගැනීම
(2) ණයගැතියෙකුගෙන් රු. 7 000 ක් ව්‍යාපාරයට ලැබීම
(3) ව්‍යාපාරය රු. 8 000 ක භාණ්ඩ තොගයක් ණයට ගැනීම
(4) ව්‍යාපාරය ණයහිමියෙකුට රු. 5 000 ක් මුදලින් ගෙවීම

078749
02030001680113749

**22.** ව්‍යාපාරයක් කාර්යාලය සඳහා රු. 250 000 ක ලී බඩු 'මොරටු ලී බඩු' වෙතින් අත්පිට මුදලට ගනියි. මෙම ගනුදෙනුවට අදාළ නිවැරදි ද්විත්ව සටහන තෝරන්න.

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| (1) ගැනුම් ගිණුම | හර | රු. 250 000 | | (2) ගැනුම් ගිණුම | හර | රු. 250 000 |
| මුදල් ගිණුම | බැර | රු. 250 000 | | 'මොරටු ලී බඩු' ගිණුම | බැර | රු. 250 000 |
| (3) ලී බඩු ගිණුම | හර | රු. 250 000 | | (4) ලී බඩු ගිණුම | හර | රු. 250 000 |
| මුදල් ගිණුම | බැර | රු. 250 000 | | 'මොරටු ලී බඩු' ගිණුම | බැර | රු. 250 000 |

● පහත තොරතුරු ඇසුරෙන් අංක **23** සහ **24** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ව්‍යාපාරයක සිදු වූ ගනුදෙනු කිහිපයක් පහත දැක්වේ.

A - ණයට ගැනුම් රු. 20 000
B - අත්පිට විකුණුම් රු. 30 000
C - ණයහිමියෙකුට ගෙවීම් රු. 25 000
D - කාර්යාලයට පරිගණකයක් ණයට ගැනීම රු. 100 000

**23.** ගෙවීම් වවුචරය මූලාශ්‍ර ලේඛනය ලෙස භාවිත කරන ගනුදෙනුව වන්නේ

(1) A ය. (2) B ය. (3) C ය. (4) D ය.

**24.** ඉහත A, B, C හා D යන ගනුදෙනු සටහන් කිරීමට භාවිත **නොකරන** මූලික සටහන් පොත කුමක් ද?

(1) ගැනුම් ජර්නලය (2) විකුණුම් ජර්නලය
(3) මුදල් පොත (4) පොදු ජර්නලය

**25.** ද්විත්ව සටහන, මූලික සටහන් පොත් දෙකක සටහන් කරනු ලබන ගනුදෙනුව තෝරන්න.

(1) ණයගැතියෙකුගෙන් රු. 15 000 ක චෙක්පතක් ලැබීම
(2) සුළු මුදල් අග්‍රිමය ප්‍රතිපූරණය කිරීම සඳහා රු. 3 600 ක් ලැබීම
(3) ව්‍යාපාරයට රු. 2 500 000 ක මෝටර් රථයක් අත්පිට මුදලට ගැනීම
(4) අයිතිකරුගේ පෞද්ගලික රක්ෂණ වාරිකය වූ රු. 10 000 ව්‍යාපාරයේ මුදලින් ගෙවීම

**26.** රෙහාන්ගේ ව්‍යාපාරයේ 2023.03.31 දිනට සුළු මුදල් පොතේ ශේෂය රු. 500 ක් විය. 2023.04.01 දින සුළු මුදල් අග්‍රිමය ප්‍රතිපූරණය කිරීම සඳහා රු. 4 500 ක් ලැබුණි. 2023.04.30 දින සුළු මුදල් පොතේ ශේෂය රු. 400 ක් විය. 2023.05.01 දින සුළු මුදල් අග්‍රිමය ප්‍රතිපූරණය කිරීම සඳහා ලැබූ මුදල

(1) රු. 4 500 කි. (2) රු. 4 600 කි. (3) රු. 5 000 කි. (4) රු. 5 400 කි.

**27.** ශක්ති ව්‍යාපාරයේ සිදු වූ ගනුදෙනුවකට අදාළ ලෙජරයේ තැබූ ද්විත්ව සටහන පහත දැක්වේ.

| | | |
|---|---|---|
| බැංකු ගිණුම | හර | රු. 12 000 |
| විකුණුම් ගිණුම | බැර | රු. 12 000 |

ඉහත ද්විත්ව සටහනට අදාළ ගනුදෙනුව තෝරන්න.

(1) ණයගැතියෙකුගෙන් ලද රු. 12 000 ක චෙක්පත බැංකුවේ තැන්පත් කිරීම
(2) අත්පිට විකුණුම් සඳහා ලද රු. 12 000 ක චෙක්පත සැපයුම්කරුට පැවරීම
(3) අත්පිට විකුණුම් සඳහා ලද රු. 12 000 ක චෙක්පත එම අවස්ථාවේ ම බැංකුවේ තැන්පත් කිරීම
(4) පසුගිය සතියේ විකුණුම් සඳහා ලැබූ රු. 12 000 ක චෙක්පත බැංකුවේ තැන්පත් කිරීම

**28.** සත්සර ව්‍යාපාරයේ 2023.03.31 දිනට බැංකු ගිණුමේ ශේෂය රු. 12 500 ක් විය. එදිනට බැංකු ප්‍රකාශනයේ ශේෂය රු. 9 000 කි. මෙම වෙනසට බලපෑවේ එක් ගනුදෙනුවක් පමණි. එම ගනුදෙනුව වන්නේ

(1) ණයගැතියෙකු විසින් ඍජුව ම ව්‍යාපාරයේ බැංකු ගිණුමට එවන ලද රු. 3 500 ක මුදල ය.
(2) ව්‍යාපාරයේ බැංකු ගිණුමට ඍජුව ම එවන ලද රු. 3 500 ක ලාභාංශ ආදායම ය.
(3) බැංකුවට ඉදිරිපත් නොකළ ව්‍යාපාරය විසින් ණයහිමියෙකුට නිකුත් කළ රු. 3 500 ක චෙක්පත ය.
(4) ස්ථාවර නියෝග මත බැංකුව විසින් ගෙවන ලද රු. 3 500 ක විදුලි බිල ය.

[පස්වැනි පිටුව බලන්න.

**29.** බැංකු ප්‍රකාශනය ලැබීමෙන් පසු, ව්‍යාපාරයේ බැංකු ගිණුමේ ශේෂය සංශෝධනය කිරීමේ දී බැංකු ගිණුමට හර කරනු ලබන ගනුදෙනුව තෝරන්න.

(1) ස්ථාවර නියෝග මත බැංකුව ගෙවූ විදුලි ගාස්තු රු. 2 500
(2) බැංකුව අයකරගත් චෙක්පොත් ගාස්තුව රු. 1 500
(3) ණයගැතියෙකු විසින් සෘජුව ම බැංකුවේ තැන්පත් කළ මුදල රු. 5 000
(4) බැංකුව අයකරගත් සේවා ගාස්තුව රු. 2 000

**30.** ලාභ අරමුණු කර නොගත් සංවිධාන නිශ්චිත කාලච්ඡේදයක් තුළ සිදුකළ ආර්ථික ක්‍රියාකාරකම්වල ප්‍රතිඵල ගණනය කිරීම සඳහා පිළියෙල කරන්නේ

(1) ආදායම් හා වියදම් ගිණුම ය.
(2) ලැබීම් හා ගෙවීම් ගිණුම ය.
(3) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය ය.
(4) වෙළෙඳ හා ලාභාලාභ ගිණුම ය.

**31.** ක්‍රීඩා සමාජයක ලැබීම් හා ගෙවීම් ගිණුමේ සටහන් වන නමුත් ආදායම් හා වියදම් ගිණුමේ ඇතුළත් **නොවන** ගනුදෙනුව කුමක් ද?

(1) ක්‍රීඩා උපකරණ මිලට ගැනුම් රු. 2 500
(2) සාමාජික මුදල් ලැබීම් රු. 5 000
(3) පුවත්පත් විකුණුම් රු. 2 000
(4) ක්‍රීඩා උපකරණ ක්ෂය රු. 1 000

- පහත තොරතුරු ඇසුරෙන් අංක **32** සිට **34** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

2023.01.31 දිනෙන් අවසන් මාසය තුළ ලී අල්මාරි නිෂ්පාදනය කරන ව්‍යාපාරයකට අදාළ වියදම් පහත දැක්වේ.

| | රු. |
|---|---|
| A – ලී මිල දී ගැනීම ........................ | 280 000 |
| B – වඩු කාර්මික වැටුප ........................ | 200 000 |
| C – වැලි කඩදාසි, පොලිෂ්, ඇණ ආදී ද්‍රව්‍ය සඳහා ..... | 15 000 |
| D – විදුලි බිල ........................ | 12 000 |
| E – මෝස්තර නිර්මාණ වියදම ........................ | 17 000 |
| F – යන්ත්‍ර අළුත්වැඩියා වියදම ........................ | 5 000 |

**32.** ලී අල්මාරි නිෂ්පාදනයේ ප්‍රාථමික පිරිවැය ගණනය කිරීමට අදාළ අයිතම පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) A හා B (2) A, B හා C (3) A, B හා E (4) A, B, C හා E

**33.** 2023.01.31 දිනෙන් අවසන් මාසය සඳහා ලී අල්මාරි නිෂ්පාදනයට අදාළ නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය වන්නේ

(1) රු. 17 000 කි. (2) රු. 32 000 කි. (3) රු. 44 000 කි. (4) රු. 49 000 කි.

**34.** ලී අල්මාරි නිෂ්පාදනයේ වක්‍ර ද්‍රව්‍ය පිරිවැයට අදාළ වියදමක් වන්නේ

(1) A ය. (2) B ය. (3) C ය. (4) D ය.

078749

0103000168011 3749

- පහත තොරතුරු ඇසුරෙන් අංක **35** සිට **40** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
  2022.01.01 දින ආරම්භ කරන ලද අමරගේ ව්‍යාපාරයේ 2022.12.31 දිනට පිළියෙල කළ ශේෂ පිරික්සුමෙන් උපුටාගත් තොරතුරු කිහිපයක් පහත දැක්වේ.

| | රු. |
|---|---|
| ප්‍රාග්ධනය | 200 000 |
| මුදල් ශේෂය | 28 000 |
| විකුණුම් | 300 000 |
| ණයගැතියෝ | 35 000 |
| ණයහිමියෝ | 45 000 |
| ගැනුම් | 190 000 |
| ලී බඩු හා උපකරණ | 120 000 |
| 10% බැංකු ණය | 100 000 |

**අමතර තොරතුරු :**

1. වර්ෂය තුළ දී ගොඩනැගිලි කුලී ලෙස රු. 24 000 ක් මුදලින් ගෙවා ඇති අතර, මාසික ගොඩනැගිලි කුලිය රු. 2 500 කි.
2. ලී බඩු හා උපකරණ වාර්ෂිකව 5% බැගින් සරල මාර්ග ක්‍රමයට ක්ෂය කෙරේ.
3. 2022.12.31 දිනට ණයගැති ශේෂයෙන් රු. 5 000 ක් බොල් ණය ලෙස කපා හැරිය යුතු ය.
4. බැංකු ණය මුදල ලබාගෙන ඇත්තේ 2022.07.01 දින ය. 2022.12.31 දින තෙක් පොලිය ගෙවා නොමැත.
5. 2022.12.31 දිනට ඉතිරි තොගය රු. 44 000 කි.

**35.** අමරගේ ව්‍යාපාරයේ දළ ලාභය නිවැරැදිව ගණනය කිරීම දැක්වෙන පිළිතුර තෝරන්න.
(1) රු. 300 000 – රු. 190 000 (2) රු. 190 000 – රු. 44 000
(3) රු. 300 000 – (රු. 190 000 + රු. 44 000) (4) රු. 300 000 – (රු. 190 000 – රු. 44 000)

**36.** අමරගේ ව්‍යාපාරයේ 2022.12.31 දිනෙන් අවසන් වර්ෂයේ ගොඩනැගිලි කුලී වියදම කොපමණ ද?
(1) රු. 2 500 (2) රු. 6 000 (3) රු. 24 000 (4) රු. 30 000

**37.** අමරගේ ව්‍යාපාරයේ 2022.12.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වගකීමක් වන්නේ
(1) ගෙවිය යුතු ගොඩනැගිලි කුලිය රු. 6 000 කි.
(2) ගෙවිය යුතු බැංකු ණය පොලී රු. 10 000 කි.
(3) ගෙවූ ගොඩනැගිලි කුලී රු. 24 000 කි.
(4) බැංකු ණය රු. 100 000 කි.

**38.** අමරගේ ව්‍යාපාරයේ 2022.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පිළියෙල කළ ආදායම් ප්‍රකාශනයේ දැක්වෙන පරිපාලන වියදම් අයිතම පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.
(1) ලී බඩු ක්ෂය, ණය පොලී (2) බොල් ණය, ගොඩනැගිලි කුලී
(3) ගොඩනැගිලි කුලී, ලී බඩු ක්ෂය (4) බොල් ණය, ණය පොලී

**39.** අමරගේ ව්‍යාපාරයේ 2022.12.31 දිනෙන් අවසන් වර්ෂයේ ලාභාලාභ ප්‍රකාශනයේ ඇතුළත් කළ යුතු බැංකු ණය පොලිය වන්නේ
(1) රු. 5 000 කි. (2) රු. 10 000 කි. (3) රු. 100 000 කි. (4) රු. 105 000 කි.

**40.** 2022.12.31 දිනට අමරගේ ව්‍යාපාරයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දැක්වෙන ණයගැති වටිනාකම
(1) රු. 5 000 කි. (2) රු. 30 000 කි. (3) රු. 35 000 කි. (4) රු. 40 000 කි.

**

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**60 | S | I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2022 (2023)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2022 (2023)
General Certificate of Education (Ord. Level) Examination, 2022 (2023)

| | |
|---|---|
| ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය | I, II |
| வணிகக் கல்வியும் கணக்கீடும் | I, II |
| Business and Accounting Studies | I, II |

## ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය II

*උපදෙස්:*

※ **පළමුවන** ප්‍රශ්නය ඇතුළුව I කොටසෙන් ප්‍රශ්න **දෙකක්** ද, II කොටසෙන් ප්‍රශ්න **දෙකක්** ද බැගින් තෝරාගෙන ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

※ උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න. ඊට වැඩියෙන් ලියා ඇති පිළිතුරු, අයදුම්කරු විසින් කපා හැර නොමැති අවස්ථාවල දී ලකුණු නොකර ම කපා හරිනු ලැබේ.

**1.** පහත සිද්ධිය ඇසුරෙන් අංක (i) සිට (x) දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

පොලොන්නරුවේ පදිංචි රාජා 2023.01.01 දින රු. 800 000 ක් යොදවා සහල් අලෙවි කිරීමේ ව්‍යාපාරයක් 'හෙළ සහල්' නමින් කුලියට ගත් ගොඩනැගිල්ලක ආරම්භ කරන ලදී. එදින ම 12% වාර්ෂික පොලියකට රු. 500 000 ක ණය මුදලක් ග්‍රාමීය බැංකුවෙන් ලබාගෙන රු. 900 000 ක් වටිනා වී මෝලක් සහ රු. 100 000 ක අනෙකුත් උපකරණ මිල දී ගන්නා ලදී.

ව්‍යාපාර පරිපාලන උපාධිය නිමවා පැමිණි රාජාගේ පුත්, කෝසල මෙම ව්‍යාපාරයේ කළමනාකරණ කටයුතු සිදු කරයි. තම්බාගත් වී අව්වේ වේලීම සහ වී කෙටීම සඳහා සුපුන් බඳවා ගන්නා ලදී.
2023.01.31 දිනෙන් අවසන් මාසය තුළ සිදු වූ ගනුදෙනු පහත දැක්වේ.

| | රු. |
|---|---|
| අත්පිට මුදලට වී මිල දී ගැනීම | 150 000 |
| අත්පිට මුදලට සහල් විකිණීම | 431 500 |
| විදුලි බිල්පත ගෙවීම | 15 000 |
| සේවක වැටුප ගෙවීම | 60 000 |
| බෙදාහැරීමේ රථ කුලී ගෙවීම | 40 000 |
| කළමනාකරුගේ වේතනය ගෙවීම | 50 000 |
| දහයියා විකිණීම | 50 000 |

**අමතර තොරතුරු:**

- වී මෝල වාර්ෂිකව 12% බැගින් සරල මාර්ග ක්‍රමයට ක්ෂය කළ යුතු ය.
- 2023.01.31 දිනට ඉතිරි සහල් හෝ වී තොග නොමැත.
- බැංකු ණය මුදල සඳහා 2023.01.31 දිනට පොලිය ගෙවා නොමැත.
- මාසික ගොඩනැගිලි කුලී රු. 10 000, 2023.01.31 දින තෙක් ගෙවා නොමැත.

පසුගිය කන්නයේ පැවති දැඩි නියගය නිසා වී නිෂ්පාදනය අඩු වීමත් සමග සහල් නිෂ්පාදකයින් අතර දැඩි තරඟකාරිත්වයක් පැවතුණි. රජය වී මිල දී ගැනීම සඳහා පාලන මිලක් ද නියම කරන ලදී. මේ නිසා 'හෙළ සහල්' ව්‍යාපාරය සහල් කිලෝග්‍රෑමයක විකුණුම් මිල රුපියලකින් අඩු කිරීමට තීරණය කර ඇත.

(i) (අ) 'හෙළ සහල්' ව්‍යාපාරය සපුරාලනු ලබන මිනිස් වුවමනාව කුමක් ද?
(ආ) 'හෙළ සහල්' ව්‍යාපාරයේ ඇල්මැති පාර්ශ්ව **දෙකක්** නිදසුන් සහිතව සඳහන් කරන්න.

(ii) 'හෙළ සහල්' ව්‍යාපාරයේ නිෂ්පාදන සාධක වන භූමිය, ශ්‍රමය, ප්‍රාග්ධනය සහ ව්‍යවසායකත්වය සඳහා නිදසුන බැගින් සිද්ධියෙන් උපුටා ලියන්න.

(iii) (අ) 'හෙළ සහල්' ව්‍යාපාරයේ ශක්තියක් සහ තර්ජනයක් සඳහන් කරන්න.
(ආ) සිද්ධියේ ඇතුළත් 'හෙළ සහල්' ව්‍යාපාරයේ ආර්ථික පරිසර සාධකයක් සඳහා නිදසුනක් ලියන්න.

(iv) 'හෙළ සහල්' ව්‍යාපාරයේ පහත එක් එක් දෑ සඳහා නිදසුන බැගින් ලියන්න.

(අ) අලෙවිකරණ මිශ්‍රයේ නිෂ්පාදිතය

(ආ) කළමනාකරණ කාර්යයක් වන සැලසුම්කරණය

(v) බැංකු ණය මුදල ලබා ගැනීමට අදාළ ද්විත්ව සටහන වටිනාකම් සහිතව ලියන්න.

(vi) (අ) 'හෙළ සහල්' ව්‍යාපාරය භාවිත කරන මූලාශ්‍ර ලේඛන **දෙකක්** ලියන්න.

(ආ) 'හෙළ සහල්' ව්‍යාපාරයේ නිෂ්පාදන පිරිවැය තුළ ඇතුළත් සෘජු පිරිවැයක් සහ වක්‍ර පිරිවැයක් වටිනාකම් සහිතව ලියන්න.

(vii) 2023.01.31 දිනට 'හෙළ සහල්' ව්‍යාපාරයේ අත ඉතිරි මුදල ගණනය කරන්න.

(viii) 'හෙළ සහල්' ව්‍යාපාරයේ 2023.01.31 දිනෙන් අවසන් මාසය සඳහා ශුද්ධ ලාභය හෝ අලාභය ගණනය කරන්න.

(ix) 2023.01.31 දිනට 'හෙළ සහල්' ව්‍යාපාරයේ ජංගම වගකීම් **දෙකක්** වටිනාකම් සහිතව සඳහන් කරන්න.

(x) 2023.01.31 දිනට 'හෙළ සහල්' ව්‍යාපාරයේ මුළු වත්කම් හා හිමිකම ගණනය කරන්න.

**(ලකුණු 02 × 10 = 20 යි)**

## I කොටස - ව්‍යාපාර අධ්‍යයනය

(ප්‍රශ්න **දෙකකට** පමණක් පිළිතුරු සපයන්න.)

2. (i) ඒක පුද්ගල ව්‍යාපාරයක, ව්‍යාපාර නාමය ලියාපදිංචි කිරීමෙන් ලැබෙන වාසි **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(ii) පහත සඳහන් ප්‍රකාශ **සත්‍ය** ද **අසත්‍ය** ද යන්න දක්වන්න.

(අ) ව්‍යාපාරයක් සැම විට ම මිනිස් අවශ්‍යතාවක් හා වුවමනාවක් සපුරාලයි.

(ආ) ව්‍යාපාරයක් සැම විට ම ලාභ ලැබීමේ අරමුණින් ආරම්භ කරනු ලැබේ.

(ඉ) ව්‍යාපාරයක ඇල්මැති පාර්ශ්ව සැම විට ම ව්‍යාපාරයේ අභ්‍යන්තර පරිසරයට අයත් වේ.

(ඊ) සංස්ථාපිත සමාගමක ආයෝජකයෙකුගේ වගකීම, ආයෝජිත මුදලේ වටිනාකමට සීමා වේ. (ලකුණු 02 යි)

(iii) සීමාසහිත 'ලක් තේ' පෞද්ගලික සමාගම, ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයේ සහ ග්‍රාමීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ අනුමැතිය ඇතිව ඌව පළාතේ ජනතාවට නළ ළිං 50 ක් ස්ථාපනය කර දීමේ ව්‍යාපෘතියක් ආරම්භ කරන ලදී.

(අ) ව්‍යාපෘතිය මගින් සපුරාලන මිනිස් අවශ්‍යතාව හා වුවමනාව පිළිවෙළින් ලියන්න.

(ආ) සිද්ධියේ ඇතුළත් ව්‍යාපාර සංවිධාන **දෙකක්** සඳහන් කර, ඒවා අයිතිය අනුව වර්ග කර දක්වන්න.

(ලකුණු 02 යි)

(iv) ව්‍යාපාර දෙකක් විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග දෙකක් පහත දැක්වේ.

**A** – ෆාස්ට් කෑෂ් (Fast cash) මූල්‍ය සමාගම ශ්‍රී ලංකා මහ බැංකුවේ නිර්දේශවලට අනුව තම තැන්පතු සඳහා වාර්ෂික පොලිය 15% සිට 20% දක්වා ඉහළ දැමීම

**B** – 'අමරස' කජු නිෂ්පාදකයෝ, අන්තර්ජාලයෙන් ඇණවුම් කරන ගනුදෙනුකරුවන් සඳහා නව පරිගණක යෙදුමක්, එන්ඩ් සොෆ්ට්වෙයා (End Software) පෞද්ගලික සමාගමෙන් ලබා ගැනීම

(අ) ඉහත **A** හා **B** ක්‍රියාමාර්ගවලට අදාළ පරිසර සාධක නම් කරන්න.

(ආ) ඉහත **A** හා **B** හි ඇතුළත්

1. සේවා සපයන ව්‍යාපාරයක් සඳහන් කරන්න.
2. භාණ්ඩ නිෂ්පාදන ව්‍යාපාරයක් සඳහන් කරන්න. (ලකුණු 02 යි)

**(මුළු ලකුණු 08 යි)**

3. (i) ප්‍රවාහන මූලිකාංග නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) පහත සඳහන් ප්‍රකාශ **සත්‍ය** ද **අසත්‍ය** ද යන්න දක්වන්න.

(අ) අවසාන පාරිභෝජනය සඳහා භාණ්ඩයක් හෝ සේවාවක් විකිණීම සිල්ලර වෙළෙඳාම වේ.

(ආ) සන්නිවේදන ක්‍රියාවලියේ ප්‍රතිග්‍රාහකයා, එවනුවා සම්බන්ධයෙන් ක්‍රියා කරන ආකාරය, ප්‍රතිපෝෂණයයි.

(ඉ) ණයපතක් ලබා ගැනීම සඳහා පුද්ගලයෙකුට බැංකුවක ගිණුමක් තිබිය යුතු වේ.

(ඊ) ජීවිතයක් හෝ දේපළක් රක්ෂණය කිරීමට යම් පාර්ශ්වයකට ඇති නීත්‍යානුකූල අයිතිය, රක්ෂා හිමිකම වේ.

(ලකුණු 02 යි)

PAST PAPERS WIKI

WWW.PastPapers.WIKI

Past Papers Wiki - Download More Past Papers and Study Well!



/නවවැනි පිටුව බලන්න.